# මුල් ළමා කාල සේවා (Early Childhood Services) ආරම්භයේදී දරුවන් ඉංග්‍රීසි භාෂාව අතිරේක භාෂාවක් ලෙස ඉගෙනීම.



මුල් ළමා කාල සේවාවන් තුල ධනාත්මක ආරම්භයක් ඇති කිරීම ඉතා වැදගත් වේ.

මුල් ළමා කාල සේවා ආරම්භයට පෙර දෙමාපියන් හා දරුවන් අදාළ සේවා ස්ථාන බැලීමට යාම වැදගත්ය. ආරම්භයේදී කෙටි වැඩ සටහන් වලට පිවිස පසුව දිගු වැඩ සටහන් වල නියුක්ත වීමෙන් දරුවන්ට පහසුවෙන් එම පරිසරයට අනුකූලව හැඩගැසීමට අවස්ථාවක් සැලසේ.



දෙමාපියන්ට අධ්‍යාපකයන්ගේ සුහදශීලි බව බලාපොරොත්තු විය හැකි අතර ඉංග්‍රීසි හැර අනෙකුත් භාෂා භාවිතා කිරීමට ඔවුනට අනුබල දිය හැක. බොහෝ සේවාවන් දුරකථන හරහා පරිවර්තනය සේවා ලබා දෙමින් ඉංග්‍රීසි භාෂාව අතිරේක භාෂාවක් ලෙස වැඩි දියුණු කර ගන්නා දෙමවුපියන්ට අදාළ තොරතුරු තේරුම් ගැනීමට සහාය ලබාදේ. තවද ඇතැම් විට අමතරව ලබාදෙන කෙටි කාලීන ද්වි භාෂා සහාය ඉංග්‍රීසි හැර අනෙකුත් භාෂාවක් කතා කරන දරුවන්ට සේවා මධ්‍යස්ථානය තුළ හැඩ ගැසීමට උදවු වේ.

අධ්‍යාපකයන් වැඩ සටහනේ විවිධ අංශ වලට දෙමාපිය සහභාගිත්වය අපේක්ෂා කරයි. එමගින් දරුවන්ට තම නිවසට සහ මුල් ළමා කාල සේවයට වඩාත් හොඳින් සම්බන්ධ වීමට උපකාරි වේ. එමඟින් දෙමාපියන්ට තම දරුවන් මුල් ළමා කාල සේවාවන් තුල ඔවුන් නොමැතව සිටින විට පවා සේවාව තුළ සිදුවන දේ තේරුම් ගැනීමට රුකුලක් වේ.



## මුල් ළමා කාල සේවා මධ්‍යස්ථානය තුළ හැඩ ගැසීමට දෙමාපියන් විසින් දරුවන්ට සහයෝගය දිය හැකි ආකාර.

- දරුවන් සමඟ සේවාව තුළ කාලය ගත කිරීම- සේවාවේ සිදුවන දේ දරුවන්ට පැහැදිලි කරදීම, ඔවුන් සමඟ සෙල්ලම් කිරීම, කතන්දර කියාදීම, ගීත ගායනා කිරීම, අනෙකුත් දරුවන් සමඟ කතා කිරීම.
- තම දරුවන් සමඟ ඔවුන් අත්දකින දේ හා ඔවුන්ට හැගෙන දේ ගැන කතා කිරීම- ධෛර්යවන්ත කිරීම හා අනුබල දීම.



අධ්‍යාපකයන් පවුල් වල සංස්කෘතීන් හා චාරිත්‍ර තේරුම් ගෙන ඊට ගෞරව කල යුතු අතර අතීත අත්දැකීම් වලට සංවේදී විය යුතුය. තම පවුලේ තොරතුරු අධ්‍යාපකයන් සමඟ බෙදා ගැනීමෙන් අධ්‍යාපකයන්ට දරුවන් පිළිබඳ, ඔවුන්ගේ පවුල්, භාෂාව, ජීවත් වන රටාව හා ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳ තේරුම් ගත හැක. උදාහරණයක් ලෙස දෙමාපියන් ඔවුන්ගේ දරුවන් පිළිබඳ මුල් ළමා කාල සේවාවන් සඳහා ලබාදිය යුතු තොරතුරු අතර,

- දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ තොරතුරු - ප්‍රතිශක්තිකරණය, වෛද්‍ය අවශ්‍යතා, රෝග තත්ත්වයන් හා ආසාත්මිකතාවයන්;
- දෙමාපියන් විසින් දරුවන්ගේ ඉණකඩ (nappies) මාරු කරන ආකාරය;
- දරුවන් වැසිකිළි පාවිච්චි කරන ආකාරය (මුල් ළමා කාල සේවාවන් වල වැසිකිළි දොරවල් රහිත වේ. එමගින් අධ්‍යාපකයන්ට දරුවන් අධීක්ෂණය කිරීමටත් අවශ්‍ය නම් උදවු කිරීමටත් හැකිය);

- දරුවන් අනුභව කරන ආහාර, ආහාර ගන්නා වේලාවන්හිදී පිළිපදින සිරිත් විරිත්/ අනුගමනය කරන චර්යාවන්;
- දරුවන්ට කෑම කවන ආකාරය හෝ ඔවුන් තනිවම ආහාර ගන්නවාද යන්න;
- දරුවන්ගේ විවේක ගැනීමේ/ නිදාගැනීමේ අවශ්‍යතා. උදා:- දෙමාපියන් ගයන ගීත, ප්‍රියතම පොත, විශේෂ සෙල්ලම් බඩුවක් හෝ පොරවනය සහ දවසේ කවර අවස්ථාවල දරුවන් විවේක ගන්නවාද යන්න /නිදා ගන්නවාද යන්න;
- දෙමාපියන් දරුවන් සනසන ආකාරය;
- දෙමාපියන් දරුවන්ගේ චර්යාවන් සඳහා සහාය ලබාදෙන ආකාරය. උදා:- කවර විනය මාර්ග නිවසේදී භාවිතා කරනවාද යන්න;
- දරුවන් සෙල්ලම් කිරීමට කැමති කවරක් සමඟද යන්න;
- සංස්කෘතික හා පවුලේ සම්ප්‍රදායන් සහ සැමරුම්.

## දරුවන්ගේ මවුබස සහ සංස්කෘතිය මුල් ළමා කාල පසුබිමට ගෙනෙන ආකාරය

අධ්‍යාපකයන් දරුවන්ගේ සාක්ෂරතාව, ගණිත දැනුම හා කුසලතාවයන් වැඩිදියුණු කිරීම සඳහා සහයෝගය ලබා දෙන්නේ ඔවුන්ව සංවාද වලට එක්කර ගැනීමෙන්, ඔවුන්ගේ චින්තන කුසලතාවයන් නාට්‍යමය රඟ දැක්වීම තුළින් වැඩි දියුණු කිරීමෙන්, පොත් පත් හුවමාරු කර ගැනීමෙන්, කථා කියාදීමෙන්, ගීත ගායනයෙන් හා ඔවුන් සමඟ සෙල්ලම් කිරීමෙන් වේ. මෙම අත්දැකීම් ඔවුන්ට ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමටද උදවු වේ.

පහත සදහන් දේ කිරීමට දෙමාපියන්ව දිරිමත් කරයි.

- තම මවු බසින් තම දරුවන්ට හා සේවාවේ සිටින අනෙකුත් දරුවන්ට පින්තූර පොත් කියවීම හා කතාන්දර කියාදීම;
- තම දරුවන් සමඟ හා තම භාෂාව කතා කරන අනෙකුත් අය සමඟ කතා කරමින් කාලය ගත කිරීම;
- අධ්‍යාපකයාට තම භාෂාවෙන් ගීත, තාල සහ කවි ඉගැන්වීම මඟින් අධ්‍යාපකයාට ඒවා අනෙකුත් සියලු දරුවන් සමඟද බෙදා ගැනීමට අවස්ථාව ලබාදීම;
- තම සංස්කෘතියට අදාළ සංගීත හඳුන්වාදීම - පටිගත කල සංගීත හා සංගීත භාණ්ඩ;
- පින්තූර හා කලා මෙවලම් ආදී තම සංස්කෘතියට විශේෂ වූ හෝ නිරන්තරයෙන් භාවිතා කරන දේ රැගෙන ඒම.











fka CHILDREN'S SERVICES INC
Incorporating Multicultural Resource Centre

Ground Floor, 9-11 Stewart Street
Richmond, 3121
tel: +61 3 9428 4471
fax: +61 3 9429 9252
email: fkacs@fka.org.au
web: www.fka.org.au
FKA Children's Services Inc. 215663278505573